යම් ප්‍රවෘත්තියකට සිරස්තල යෙදීමේදී නිර්මාණශීලී වීමේ අයිතියත්, අඩු වචන ප්‍රමාණයකින් අදහසක් ලබාදීමේ අවශ්‍යතාවයත් නොසලකා හැරිය හැකි නොවේ. කෙසේ නමුත්, සිරස්තලයක් ඔස්සේ පාඨකයා වෙත ලබාදෙන අදහස නිරවද්‍ය වීමත්, එය සමස්ත සමාජ චිත්‍රය වෙත අදාළ විය යුතු වීමත් නොසලකා හැරිය හැකි නොවේ.

ඊට උදාහරණයක් ලෙසින් දිවයින පුවත්පතේ (07/30) මෙම පුවත් වාර්තාව දැක්විය හැක. "ශාන්ති කර්මයෙන් පිටපොට පැන්න යක්දෙස්සා රිමාන්ඩ්" යනුවෙන් මෙහි සිරස්තලයෙහි සඳහන් වේ. නමුත් පුවත් අන්තර්ගතයේ සඳහන් වන්නේ බාලවයස්කාරිනියක් ලිංගික අපයෝජනයට ලක් කිරීමකි!

මෙහිදී ලිංගික අපයෝජනයක් සිදුවී ඇති බව පුවත් සිරස්තලයෙන් ඉදිරිපත් නොවන බවට අප සියළු දෙනාටම එකඟ විය හැකි වේ. වෙනත් ලෙසකින් පවසන්නේ නම්, නීතිය ඉදිරියේ දඬුවම් ලැබෙනා වරදක් වන බාලවයස්කාර ලිංගික අපයෝජනයක් මෙම පුවත් වාර්තාවේ සිරස්තලය ඔස්සේ සැහැල්ලු ලෙසින් ඉදිරිපත් වී ඇත. එසේම ලිංගික අපයෝජනයන් මෙසේ ලඝු කොට දැක්වීම මේ වනවිට වැඩි වැඩියෙන් මාධ්‍ය තුළ දක්නට ලැබීමද කණගාටුවට කරුණකි.

මෙම ප්‍රවණතාවය ඔස්සේ බාලවයස්කාර ලිංගික අපයෝජනයන් යනුවෙන් හඳුනාගත හැකි සමාජ ගැටළුව සම්බන්ධයෙන් වඩාත් බැරෑරුම් අදහසක් මාධ්‍ය ඔස්සේ ලබාදිය යුතු නොවේද? ඒ අනුව ගත් විට, මෙවැනි සිරස්තලයන්ට ඔබට එකඟ වීමට හැකිද?

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina**